ශ්‍රී ලංකා මහ බැංකුව

**2024 දෙසැම්බර් 19** **චක්‍රලේඛය** **2024 අංක 04**

(මෙය 2024 දෙසැම්බර් 19 දින නිකුත් කරන ලද 2024 අංක 04 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි)

**බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහන සැලසීම**

2024 අංක 26 දරන බැංකු මඟින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත පිළිබඳ ක්‍රියාකාරී කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කළ පරිදි, පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීනව පැවති සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට පහත 1 වන ඡේදයෙහි සඳහන් ණය සහන බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු හරහා (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) ලබාදීමට ශ්‍රී ලංකා බැංකු සංගමය එකඟ වී ඇත.

තවද, පරාටේ බලතල ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම 2025.03.31 දිනෙන් ඔබ්බට ක්‍රියාත්මක නොවනු ඇත යන අදහස මත පදනම්ව ශ්‍රී ලංකා බැංකු සංගමය මෙම ණය සහන ලබා දී ඇත.

**1. ණය සහන වල ලක්ෂණ**

1.1 පහත සඳහන් නිර්ණායක සපුරාලන කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන් විසින් බලපත්‍රලාභී බැංකු මඟින් ලබා ගෙන ඇති ණය පහසුකම් සඳහා පමණක් මෙම ණය සහන අදාළ වන අතර මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කරනු ඇත.

- (අ) 2019.04.01 දින හෝ ඉන් පසුව අදියර 3 හි ණය ලෙස වර්ගීකරණය කර ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන්ගේ ණය පහසුකම්, සහ
- (ආ) අවශ්‍ය සියලුම ලියකියවිලි ඉදිරිපත් කිරීමට යටත්ව, 2025.03.31 වන විට ව්‍යාපාරය යළි පණ ගැන්වීම පිළිබඳව අදාළ බැංකුවල ව්‍යාපාර යළි පණ ගැන්වීමේ ඒකක සමඟ සාකච්ඡා ආරම්භ කර ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර.

1.2 ණය ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර යළි පණ ගැන්වීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින් ඉහත 1.1 ඡේදයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ හානිකරණයට ලක් වූ ණය, පහත දක්වා ඇති පරිදි ප්‍රතිලේඛනගත කිරීම.

- (අ) 2025.06.15 දිනට පෙර, සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන් සමඟ ණය ප්‍රතිලේඛනගත කිරීමේ ගිවිසුම්වලට එළඹීම.

(ආ) 2024.12.15 දිනට ගෙවිය යුතු මුළු හිඟ මුල් මුදල රු. මිලියන 25ට අඩු, සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන් විසින්, 2025.12.31 දිනට පෙර ප්‍රතිලේඛනගත කළ ණය ආපසු ගෙවීම ආරම්භ කිරීම.

(ඇ) 2024.12.15 දිනට ගෙවිය යුතු මුළු හිඟ මුල් මුදල රු. මිලියන 25-50 අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන් විසින්, 2025.09.30 දිනට පෙර ප්‍රතිලේඛනගත කළ ණය ආපසු ගෙවීම ආරම්භ කිරීම.

(ඈ) 2024.12.15 දිනට ගෙවිය යුතු මුළු හිඟ මුල් මුදල රු. මිලියන 50 ට වැඩි, කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන් විසින්, 2025.06.30 දිනට පෙර ප්‍රතිලේඛනගත කළ ණය ආපසු ගෙවීම ආරම්භ කිරීම.

1.3 ප්‍රතිලේඛනගත කිරීමේ ගිවිසුම් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය තත්වය සැලකිල්ලට ගනිමින්, සුදුසුකම්ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන්ගේ 2019.04.01 දින සිට 2024.12.15 දින දක්වා කාල සීමාවට අදාළ නොගෙවූ ණය පොලී (ප්‍රාග්ධනිත ණය පොලී හැර), පහත වගුව 1 හි දක්වා ඇති පරිදි නිදහස් කිරීම.

**වගුව 1: පොලී නිදහස් කිරීම්**

| **2024.12.15 දිනට ණය වටිනාකම** | **2019.04.01 දින සිට 2024.12.15 දින දක්වා නොගෙවූ පොලී ගෙවීම සඳහා ලබා දෙන ලද පොලී නිදහස් කිරීම්** | | |
|---|---|---|---|
| | **මාස 6 ක් ඇතුළත ගෙවීම් කළහොත්** | **මාස 12 ක් ඇතුළත ගෙවීම් කළහොත්** | **මාස 12 කට වැඩි නමුත් මාස 60 කට අඩු කාලයක් තුල ගෙවීම් කළහොත්** |
| සමස්ත හිඟ මුල් ණය මුදල: රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා | 65% | 50% | 40% |
| සමස්ත හිඟ මුල් ණය මුදල: රු. මිලියන 10 සිට රු. මිලියන 25 දක්වා | 35% | 25% | 20% |

1.4 අවස්ථානුකූලව, ණය ගනුදෙනුකරුවන්ගේ නැවත ගෙවීමේ හැකියාව සහ විශ්වාසනීය ව්‍යාපාර යලි පණගැන්වීමේ සැලසුම් ඉදිරිපත් කිරීමට යටත්ව, බලපත්‍රලාභී බැංකුවලට සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට කාරක ප්‍රාග්ධන පහසුකම් ලබා දීම ඇතුළු තවත් සහන ලබා දීම සම්බන්ධව සලකා බැලිය හැකිය.

**2. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත (CRIB) වාර්තා කිරීම**

2.1 බලපත්‍රලාභී බැංකු විසින් ඉහත 1 වන ඡේදය යටතේ ප්‍රතිව්‍යුහගත කරන ලද ණය පහසුකම් පිළිබඳව වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ උපදේශනයන්ද සහිතව සුදුසු වාර්තාකරණ ක්‍රමවේදයක් සකස් කළ හැකිය.

2.2 මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන ණය අයදුම්පත් බලපත්‍රලාභී බැංකු විසින් අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ වාර්තා මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීම සිදු නොකළ යුතුය.

**3. ණය සහන ලබාදීමේ විනිවිදභාවය**

3.1 ඉහත සඳහන් ණය සහන ලබා දීම සම්බන්ධයෙන් ප්‍රතික්ෂේප කිරීමක්/මතභේදයක් ඇති වුවහොත්, බලපත්‍රලාභී බැංකු විසින් එවැනි ප්‍රතික්ෂේප කිරීමක්/මතභේදයක් ඇතිවීමට හේතු වූ කරුණු ණය ගනුදෙනුකරු වෙත දැනුම්දිය යුතු අතර, අයදුම්කරුට එම ප්‍රතික්ෂේප කිරීමට/මතභේදයට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙන බවද දන්වා සිටිය යුතුය.

3.2 සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම පරිදි, බලපත්‍රලාභී බැංකු විසින් ණය මුදලේ මුල් මුදල, පොලිය සහ අනෙකුත් ගාස්තු පිළිබඳ විස්තර ලබා දිය යුතුය.

අත්සන් කළේ,

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**

*පාලක මණ්ඩල සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති*